**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ "බී" අර්ථසාධක අරමුදල - 2014**

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ "බී" අර්ථසාධක අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභා ලාභ ගිණුම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1979 ජුනි 01 දිනැති අංක 38/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ I කොටස : (I) වගන්තිය සාමාන්‍ය 9 ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**1.3 විගණකගේ වගකීම**

**මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.**

**මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම**

**පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.**

**මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**2 මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ - "බී" අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ ප්‍රමිති**

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි සඳහන් ආකෘතියේ පරිදි අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.**

**2.2.2** ගිණුම්කරණ අඩුපාඩු

**පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.**

**(අ)** **සාවද්‍ය ගණනය කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර තැන්පතු මත පොලී සහ ලැබිය යුතු පොලී පිළිවෙලින් රු.13,542 කින් හා රු.10,849 කින් වැඩියෙන් දක්වා තිබුණි.**

**(ආ)** **මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කේවල අරමුදල් ශේෂයන් හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් අතර රු.1,795,887 ක වෙනසක් නිරීක්ෂණය විය.**

**2.2.3** නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1979 ජුනි 01 දිනැති අංක 38/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ රීති අංක 04 අනුව සාමාජිකයන්ගේ බැරට පවත්නා සියළු මුදල් රජයේ බැංකුවක ණයකරවල හෝ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුය. කෙසේ වුවද මෙම උපදෙස් වලට පටහැනිව රු.5,715,483 ක් වූ සියලු මුදල් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.**

**3.** මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵල

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය සාමාජිකයන්ගේ ගිණුම් වලට බැර කරන ලද රු.816,974 ක පොලියක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා සාමාජිකයන්ගේ ගිණුම්වලට බැර කරන ලද පොලිය රු.840,061 ක් වූයෙන් රු.23,087 කින් හෙවත් සියයට 2.75 කින් මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමක් දැක්වුණි. මෙම සෘණාත්මක උපනතියට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සමාලෝචිත වර්ෂය තුළ සාමාජිකයන්ගේ විශ්‍රාමයාම හේතුවෙන් බැංකුවේ අතිරේක දායකය අඩුවීමයි.**

**3.2 මෙහෙයුම් සමාලෝචනය**

**3.2.1 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ලබාගත හැකිවූ තොරතුරු අනුව, ඉකුත් වර්ෂ 3 තුළ හා සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| (i) | ස්ථාවර තැන්පතු හා ඉතිරි කිරීම් ගිණුම් මත පොලී ආදායම | 646,420 | 343,215 | 1,280,552 | 1,675,320 |
| (ii) | සාමාජිකයන්ට දෙන ලද ණය මත පොලී ආදායම | - | - | 110,860 | 67,197 |
| (iii) | උපයන ලද මුළු පොලී ආදායම | 646,420 | 343,215 | 1,391,412 | 1,742,517 |
| (iv) | බැංකු ගාස්තු | (2,000) | - | - | - |
| (v) | බදු වියදම් | (81,697) | (84,006) | (187,232) | (181,306) |
| (vi) | ශුද්ධ පොලී ආදායම | 562,723 | 259,209 | 1,204,180 | 1,561,211 |
| (vii) | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් අතිරේක දායකය | 254,251 | 580,852 | 1,095,370 | 251,853 |
| | සාමාජිකයන් සඳහා බැර කරන ලද මුළු පොලිය | 816,974 | 840,061 | 2,299,550 | 1,813,064 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 සිට 2013 කාල පරිච්ඡේදය තුළ ස්ථාවර තැන්පතු හා ඉතිරි කිරීම් ගිණුම් මත පොලී ආදායම රු.1,675,320 සිට රු.343,215 දක්වා සියයට 79.5 කින් අඩුවී තිබූ අතර පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කාලීන පොලී ආදායම රු.646,420 ක් දක්වා සියයට 88.34 කින් වැඩිවී තිබුණි.

(ආ) 2011 වර්ෂයේ අතිරේක දායකය රු.251,853 සිට 2012 වර්ෂයේදී රු.1,095,370 ක් දක්වා සියයට 334.92 කින් වැඩිවී තිබූ අතර 2013 සිට 2014 කාල පරිච්ඡේදය තුළ එය රු.580,852 සිට රු.254,251 දක්වා සියයට 56.22 කින් සැලකිය යුතු ලෙස අඩු වී තිබුණි.

### 3.2.2 සාමාජික දායකය

විගණනයට ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සාමාජිකයන්ගේ දායකය බැංකු, දායකය හා සාමාජික ගිණුම්වලට බැර කරන ලද පොලී පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2014 | | | | 2013 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සාමාජික දායකය | බැංකු දායකය | බැර කරන ලද පොලී | එකතුව | සාමාජික දායකය | බැංකු දායකය | බැර කරන ලද පොලී | එකතුව |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ඉදිරියට ගෙන එන ලද ශේෂය | 1,089,893 | 1,634,664 | 5,034,137 | 7,758,694 | 996,709 | 1,494,889 | 4,224,720 | 6,716,318 |
| <u>එකතු කළා</u> | | | | | | | | |
| වර්ෂය තුළ දායකය | 95,385 | 143,078 | 816,975 | 1,055,438 | 93,184 | 139,776 | 840,061 | 1,073,021 |
| එකතුව | 1,185,278 | 1,777,742 | 5,851,112 | 8,814,132 | 1,089,893 | 1,634,665 | 5,064,781 | 7,789,339 |
| <u>අඩුකළා</u> | | | | | | | | |
| වැඩිපුර බැර කරන ලද පොලී 2012 | - | - | - | - | - | - | (30,644) | (30,644) |
| ඉදිරියට ගෙනයන ලද ශේෂය | 1,185,278 | 1,777,742 | 5,851,112 | 8,814,132 | 1,089,893 | 1,634,665 | 5,034,137 | 7,758,695 |

2013 වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අරමුදලට මුළු දායකය රු.17,583 කින් හෙවත්, සියයට 1.63 කින් අඩුවී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී සාමාජිකයන් විශ්‍රාම නොගැනීම හේතුවෙන් සාමාජිකයන්ට කිසිදු ගෙවීමක් සිදුකර නොතිබුණි.

**3.2.3 සාමාජිකයන්ට ලබාදුන් ණය**

**විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ සමාජිකයන්ට කිසිඳු ණය මුදලක් ලබාදී නොතිබුණු අතර සාමාජිකයන්ගෙන් අයකිරීම් කර නොතිබූ අතර රු.7,275 ක මුදලක් දීර්ඝ කාලයක සිට නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.**

**4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

**2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදයට අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන්වී මාස 2 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2015 මැයි 08 දිනදීය.**

**4.2 අරමුදල පිහිටුවීම, අධිකාරි බලය සහ අරමුණු**

**1975 අංක 13 දරන ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 85(2) වගන්තිය ප්‍රකාරව අරමුදල පිහිටුවන ලදි. ඒ අනුව මාසික වැටුප් ලබන ලංකා කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාවේ සියලුම සේවකයන් ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සේවකයන් ලෙස සලකනු ලැබ ඔවුන් ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ රැකියාව භාර ගන්නා අතර ආයෝජන බැංකුව විසින් ඔවුන් රැකියාවේ යෙදවීමේ කොන්දේසියක් ලෙස අරමුදලේ සාමාජිකයන් බවට පත්වේ. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව පත්කරනු ලබන එක් අධ්‍යක්ෂවරයකුගෙන්, සාමාන්‍යාධිකාරිවරයාගෙන් හෝ ඔහු වෙනුවෙන් ඒ අවස්ථාවේ වැඩබලන පුද්ගලයාගෙන් සහ අරමුදලේ සාමාජිකයන් විසින් වාර්ෂිකව පත්කරනු ලබන සාමාජිකයකුගෙන්ද සමන්විත භාරකාර මණ්ඩලයක් මඟින් අරමුදල පරිපාලනය කෙරේ.**